## විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය

### සපයනු ලබන සේවාවන්.

- **විදේශ ගත වන කාන්තාවන් සඳහා පවුල් පසුබිම් වාර්තා නිකුත් කිරීම**
  විදේශ ගත වීමට අපේක්ෂිත කාන්තාවන්ගේ පවුලේ තොරතුරු ක්ෂේත්‍ර පරීක්ෂණයක් මගින් අධීක්ෂණය කර පවුල් පසුබිම් වාර්තාව කම්ටුවට ඉදිරිපත් කොට නිර්දේශ කිරීම හෝ නොකිරීම.

- **ශ්‍රමික සුරැකුම වැඩසටහන යටතේ ලියාපදිංචි කිරීම**
  පුද්ගලයෙකු රැකියාවක් සඳහා විදේශ ගත වූ පසු එම පුද්ගලයාව ශ්‍රමික සුරැකුම වැඩ සටහන යටතේ ලියාපදිංචි කිරීම
- **සමාජ වාර්තා සකස් කිරීම**
  පුද්ගලයෙකු රැකියාවක් සඳහා විදේශ ගත වූ පසු එම පුද්ගලයා හා අදාල තැනැත්තාගේ පවුල සම්බන්ධව සියලු විස්තර ඇතුලත් කර වාර්තාවක් සකස් කිරීම මෙ මගින් සිදු වේ.
- **පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම**
  රැකියාවක් සඳහා විදේශ ගත වූ පවුල් අතුරින් ගැටළු පවතින පවුල් හඳුනා ගෙන එම ගැටළු නිරාකරණය කිරීම සහ එම පවුල් නගා සිටු වීම සඳහා යෝග්‍ය සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම.
- **ළමා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම**
  රැකියාවක් සඳහා විදේශ ගත වූ පවුල් අතුරින් දරුවන්ගේ ගැටළු පවතින පවුල් හඳුනා ගෙන එම ගැටළුව නිරාකරණය කිරීම සඳහා යෝග්‍ය ළමා ආරක්ෂණ සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම.

- **විදේශ ගත වූ පවුල් සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කිරීම**
- **විගමණික ප්‍රජාව ඉලක්ක කර ගෙන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**
  විගමනික ප්‍රජාව ඉලක්ක කරගෙන ළමා ආරක්ෂාව හා රැකවරණය , සෞඛ්‍ය , මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳවත්, මූල්‍ය කළමණාකරනය ,උපදේශණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- **විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් සිදු කරන සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**
  පහ වසර ශිෂ්‍යත්ව විභාගය ,සා පෙළ හා උ.පෙළ විභාග වලින් සමත් වන විගමනික පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩසටහන හා විගමණික පවුල් වල දූ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.


| | |
|---|---|
| කේ.යූ.පී.ඩී.ගුණසේන | 0711836095 |
| ජේ.එම්.එස්.එන්.කේ.සමරසිංහ | 0711836062 |
| ර්.ඒ.එස්.වීරසිංහ | 0713086749 |